**ශීර්ෂය 118 -කෘෂිකර්ම අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

-----------------------------------------------------------------------------------------

ශීර්ෂය 118 - කෘෂිකර්ම අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 නොවැම්බර් 02 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරනු ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

-----------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම

-------

### 2.1. විසර්ජන ගිණුම

-----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---------------------------

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 44,970.33 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 34,745.67 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය සලසා තිබූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 10,224.66 ක් හෙවත් සියයට 22.74 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 39,847.22 | 32,497.06 | 7,350.16 | 18.45 |
| මූලධන | 5,123.11 | 2,248.61 | 2,874.50 | 56.11 |
| **එකතුව** | **44,970.33** | **34,745.67** | **10,224.66** | **22.74** |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

### පාර්ලිමේන්තුව විසින් පනවා තිබූ සීමාවන්

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 11801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබූ සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 32.00 | 29.62 | 19.00 | 20.02 | 75.00 | 54.77 |

## 2.3 අග්‍රිම ගිණුම

අමාත්‍යාංශය යටතේ අංක 7002/0000/00/0325/0016/000 දරන අග්‍රිම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.181,300 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම

අමාත්‍යාංශය යටතේ වන තැන්පත් ගිණුම් 04 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 3.93 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | **රු.මිලියන** |
| 6000/0000/00/0002/0109/000 | 0.10 |
| 6000/0000/00/0013/0030/000 | 0.64 |
| 6000/0000/00/0016/0056/000 | 1.38 |
| 6000/0000/00/0018/0068/000 | 1.81 |
| **එකතුව** | **3.93** |

## 2.5 විගණන නිරීක්ෂණය

-----------------------

කෘෂිකර්ම අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

---------------------------------------------------

## 3.1 විසර්ජන ගිණුම

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) අයවැය විචලනය

-------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 06 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.මිලියන 1.46 ක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂයේදී උපයෝජනය නොකර එම මුළු ප්‍රතිපාදනයම මුළුමණින්ම ඉතිරි කර තිබුණි.

(ii) පුනරාවර්තන වැය විෂයයන් 44 ක් හා ප්‍රාග්ධන වැය විෂයයන් 31 ක් සඳහා සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදන උපයොජනයන් කළ පසු ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 08 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

(iii) අමාත්‍යාංශය යටතේ ඇති ආයතන 3 ක කාර්යභාරයන් ඉටු කිරීම සඳහා එකතුව රු.මිලියන 105.00 ක ප්‍රතිපාදන සලසා තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 73.78 ක ප්‍රතිපාදන පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව එම ආයතන 3 වෙත සලසා තිබුණු ප්‍රතිපාදනවලින් සියයට 19 ක සිට සියයට 56 ක් දක්වා පරාසයක ප්‍රමාණයක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

### (ආ) ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළැඹීම

------------------------------------------

වැය විෂයයන් 22 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය ඉක්මවා රු.මිලියන 19.83 ක බැරකම්වලට එළඹ තිබුණි.

## 3.2 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

----------------------------------------

### 3.2.1 ක්‍රියාකාරී සැලැස්ම

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා අනුමත කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කාර්යයන් වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබීම හා සැලැසුම් ගත නොවූ විවිධ වැඩසටහන් නිසා ක්‍රියාකාරී සැලැස්ම අවස්ථා කිහිපයකදී සංශෝධනය කර තිබුණි.

### 3.2.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සාමලෝචිත වර්ෂය සඳහා වන වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2017 ජූලි 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 3.3 වත්කම් කළමණාකරණය

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අමාත්‍යාංශය සතු වාහන 62 ක් විධිමත් පරිදි පවරා දීමකින් තොරව බාහිර ආයතන 17 ක් වෙත ලබා දී තිබුණි.

**(ආ) වෙනත් ආයතන සතු වත්කම් පරිහරණය**

වෙනත් ආයතන 13 ක් සතු වාහන 45 ක් විධිමත්ව අමාත්‍යාංශය වෙත පවරා ගැනීමකින් තොරව අමාත්‍යාංශය විසින් පරිහරණය කර තිබුණි.

### 3.4 අනුකූල නොවීම්

**නීති , රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂාවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත පරිදි විය.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| **(අ) ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (i) මුදල් රෙගුලාසි 94(3) | ගරු අමාත්‍යාවරයාගේ නිවස අලුත්වැඩියාව සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුව ඉක්මවා අතිරේක වැඩවල වටිනාකම රු.10,900,478 ක් වී තිබුණි. එම අතිරික්ත වැඩවල වටිනාකම බැරකම් වශයෙන් එළඹී තිබුණු අතර 2017 ජූලි 31 වනවිටත් එම බැරකම් පියවා නොතිබුණි. |

| | | |
|---|---|---|
| | (ii) මුදල් රෙගුලාසි 210 (1) | නියමිත දිනයට හෝ ඊට ප්‍රථම බිල්පත් ගෙවීම සිදු කළ යුතු වුවත්, එම දිනයට පසුව ගෙවීම් කිරීම නිසා 2016 පෙබරවාරි මාසයේදී රු.25,926 ක ප්‍රමාද ගාස්තු ගෙවා තිබුණි. |
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය**<br>**-------------------------------------------** | |
| | (i) 11 වැනි පරිච්ඡේදයේ 13(3) වගන්තිය | පූර්ණකාලීන නිත්‍ය තනතුරක වැඩ බැලීමේ පත්වීමක උපරිම කාලය මාස 06 ක් වී තිබුණත්, පොහොර ලේකම් කාර්යාල අධ්‍යක්ෂක තනතුරු සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන හා මුදල්) 2015 මැයි 05 දින සිට මාස 15 ක කාලයක් එම තනතුරෙහි රාජකාරි ආවරණය කර තිබුණි. |
| | (ii) XV වැනි පරිච්ඡේදයේ 3(1) වගන්තිය | සේවයේ ස්ථිර කිරීම පිණිස ලබා ගත යුතු කිසියම් සුදුසුකමක් ලබා ගැනීම සඳහා මිස පරිවාස කාලයේ සිටින නිලධාරීන් අධ්‍යයනය හෝ අභ්‍යාස සඳහා විදේශ වැඩමුළුවලට හෝ පුහුණුවීම් සඳහා යොමු නොකළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී තනතුරෙහි ස්ථිර නොකළ පරිවාස කාලයේ පසුවන නිලධාරීන් දෙදෙනෙකු හා ව්‍යාපෘති නිලධාරියෙකු විදේශ වැඩමුළු හා පුහුණුවීම් සඳහා සහභාගී කර තිබුණි. |
| **(ඇ)** | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**<br>**-----------------------------** | |
| | 2009 අප්‍රේල් 16 දිනැති අංක 9/2009 දරන චක්‍රලේඛය | නියැදි විගණන පරීක්ෂාවට ලක් වූ අමාත්‍ය කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 08 දෙනෙකු සෙනසුරාදා හා ඉරිදා දිනවල ඇඟිලි සලකුණු යන්ත්‍රයේ සටහන් නොකර රාජකාරියේ යෙදී රු.138,646 ක අතිකාල දීමනා ලබා ගෙන තිබුණි. |
| **(ඈ)** | **ජනාධිපති ලේකම් චක්‍රලේඛ**<br>**------------------------------** | |
| | 2010 මැයි 14 දිනැති අංක සීජ්/1/17/1 දරන චක්‍රලේඛය | (i) ගරු අමාත්‍යවරයා, ගරු රාජ්‍ය අමාත්‍යවරයා සහ ඔවුන්ගේ කාර්යාලවලට අනුයුක්ත කාර්ය මණ්ඩලයේ පරිහරණය සඳහා වෙන් |

කළ යුතු උපරිම වාහන සංඛ්‍යාව ඉක්මවා වාහන 9 ක් වෙන් කර තිබුණි.

(ii) චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යවරයාගේ ආරක්ෂක රථයේ රියදුරු හැර රියදුරන් දෙදෙනෙකු අනුයුක්ත කළ හැකිව තිබුණි. නමුත් කෘෂිකර්ම අමාත්‍යවරයා සඳහා ඊට අමතර රියදුරන් දෙදෙනෙකු අනුයුක්ත කර තිබුණු අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේ වැටුප් වශයෙන් රු.839,197 ගෙවා තිබුණි.

(iii) අමාත්‍යවරයෙකුගේ කාර්ය මණ්ඩලයට අයත් නොවන අයෙකු වෙත අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2015 මාර්තු 09 දින සිට වාහනයක් අනුයුක්ත කර තිබුණි. මෙම තැනැත්තා සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කරන අතර එම සමාගමෙන්ද වාහනයක් පරිහරණය සඳහා ලබා ගෙන තිබුණි. වාහන දෙක සඳහා ඉන්ධන ලීටර් 300 කට අදාළ රු.30,000 ක ඉන්ධන දීමනාවක් ලබා ගෙන තිබුණි. ඊට අමතරව 2017 ජූනි 22 දින සිට කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයෙන් තවත් වාහනයක් ලබා ගෙන තිබුණි.

## 3.5 කාර්යසාධනය

### 3.5.1 පොහොර ලේකම් කාර්යාලය

1988 අංක 68 දරන පොහොර විධිමත් කිරීමේ පනත යටතේ පොහොර ආනයනය, නිෂ්පාදනය හා සකස් කිරීම සඳහා අධිකාරි බලපත්‍ර නිකුත් කිරීම යන කාර්යයන් සිදු කිරීමේ අරමුණින් කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පොහොර ලේකම් කාර්යාලය ස්ථාපනය කර තිබුණි. මෙහි කාර්යසාධනය ඇගයීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(අ) වර්තමානයේ ශ්‍රී ලංකාවේ පොහොර ආනයනය කරනු ලබන රාජ්‍ය හා පෞද්ගලික ආයතන 40 ක් පමණ පවතින අතර පොහොර සාම්පල් විශ්ලේෂණ වාර්තාවන් හි ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනීම හා විශාල කාල ප්‍රමාදය වලක්වා ගැනීමේ අරමුණින් 2015 වර්ෂයේ නව ක්‍රමවේදයක්

හඳුන්වාදී තිබුණි. සාම්පල් තත්ත්ව පරීක්ෂාවකින් පසුව වෙළඳපොළට නිකුත් කරනු ලැබේ. රාජ්‍ය නැව් 11 කින් ආනයනය කළ රු.මිලියන 296.79 ක් වටිනා පොහොර තොග සම්බන්ධයෙන් නිකුත් කළ සාම්පල්වල තත්ත්ව සහතික ලබා දීම මාස 03 ක සිට 06 ක් දක්වා පරාසයක කාලයක් ප්‍රමාද කර තිබුණි.

(ආ) පොහොර තත්ත්ව සහතික ලැබීමේ ප්‍රමාදයෙන් පොහොර තොග විකිණීම ප්‍රමාද වීම නිසා අදාළ තොග විකිණීම සඳහා ලබා දී තිබුණු ණයගැති කාලසීමාව දින 180 ක සිට දින 270 ක් දක්වා ඉකුත්වීම හා මිශ්‍ර පොහොර නිෂ්පාදනය කිරීමට ද නොහැකි වී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ගබඩා ඉඩකඩ ඇහිරී තිබුණු බැවින් පොහොර තොග රැස්කිරීමේ ගැටලු නිසා අදාළ පොහොර ඉල්ලුම සපුරාලීමටද නොහැකි වී තිබුණි.

(ඇ) පොහොර සාම්පල් රහස්‍ය කේත අංකයක් යටතේ රසායනාගාර වෙත යවනු ලබනු අතර එම කේත අංකය නිකුත් කිරීම, අදාළ සාම්පල් රසායනාගාර වෙත යැවීම, කේත අංක යටතේ ලැබෙන වාර්තා විවෘත කිරීම, නැවත ප්‍රතිකේත කිරීම, පොහොර විකිණීමේ අවසරය සමාගමට ලබා දීම යන කාර්යයන් එක් නිලධාරියෙකු සහ අතිරේක ලේකම් (මුදල් හා පාලන) විසින්ම සිදු කිරීම නිසා එහි අභ්‍යන්තර පාලනය දුර්වල වී තිබුණි. පරීක්ෂා කළ නියැදියට අනුව අවස්ථා 7 කදී එක් රසායනාගාරයකින් ප්‍රතික්ෂේප වූ සාම්පල් නැවත වෙනත් රසායානාගාරයකින් ඒවා ගුණාත්මක සාම්පල් ලෙස නිර්දේශ කර ඉදිරිපත් කර තිබුණි.

### 3.5.2 පොහොර මිලදී ගැනීම සඳහා මුදල් සහනාධාර ලබා දීම

2016 අප්‍රේල් 07 දින අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පොහොර ලබා දීම වෙනුවට ගොවීන් වෙත මුදල් සහනාධාර ලබා දීමට තීරණය කර තිබුණි. 2016 මාර්තු 09 දිනැති අංක 2016 NFS/FCG(1) දරන කෘෂිකර්ම අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව ආරම්භයේදී මුල්‍ය ආයතන 20 ක් මඟින් මෙම සහනාධාර මුදල් ලබා දීමට තීරණය කර එය ක්‍රියාත්මක කර තිබුණි. 2016 වර්ෂයේ යල හා මහ කන්න සහ 2017 වර්ෂයේ යල කන්නය සඳහා පිළිවෙලින් රු.646,857,214 , රු.6,51,277,528 හා රු. 3,440,264,875 ක් 2017 ජුලි 31 දින වන විට ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ ) සහනාධාර සදොස්ව ගෙවීම**

පොහොර මිලදී ගැනීම සඳහා මුදල් සහනාධාර ගෙවීමේදී රු.මිලියන 1,237.90 ක ගෙවීම් සදොස්ව සිදු කර තිබුණු බව නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | ගොවිජන බල ප්‍රදේශය | කන්නය | සදොස්ව ගෙවීම<br>රු. | සදොස් බව |
|---|---|---|---|---|
| (i) | කළුතර දිස්ත්‍රික්කය ප්‍රමුඛ ගොවිජන බල ප්‍රදේශ | 2016 යල | 2,411,500 | ගොවීන් නොවන අයගේ ගිණුම්වලට මුදල් බැර කිරීම |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | කුරුණෑගල දිස්ත්‍රික්කය රාජාංගනය වම් ඉවුර | 2017 යල | 2,813,800 | වගා හානි හා පොහොර සහනාධාර මුදල් ගෙවිය යුතු සීමාව ඉක්මවා ගෙවීම |
| (iii) | නියැදි පරීක්ෂාවට ලක් වූ ගොවිජන බල ප්‍රදේශ | 2016 යල | 25,483,750 | උපරිම සහනාධාර මුදල වූ රු.25,000 ක සීමාව ඉක්මවා ගෙවීම |
| (iv) | නියැදි පරීක්ෂාවට ලක් වූ ගොවිජන බල ප්‍රදේශ | 2016 මහ | 74,367,500 | -එම- |
| (v) | නියැදි පරීක්ෂාවට ලක් වූ ගොවිජන බල ප්‍රදේශ | 2017 යල | 1,095,000 | -එම- |
| (vi) | දිස්ත්‍රික්ක 16 ක නියැදි පරීක්ෂාවට ලක් වූ ගොවිජන බල ප්‍රදේශ | 2016 යල | 1,131,723,030 | වගා නොකළ කුඹුරු ඉඩම් සඳහා සහනාධාර මුදල් ගෙවීම |
| | **එකතුව** | | **1,237,894,580** | |

**(ආ) කන්නයට අදාළ කාල පරිච්ඡේදය අවසන් වූ පසු සහනාධාර ගෙවීම**

2016 වර්ෂයේ යල කන්නය සඳහා 2016 ජුනි 30 දිනෙන් පසුව රු.3,554.39 ක් ද, 2016 මහ කන්නය සඳහා 2017 පෙබරවාරි 15 දිනෙන් පසුව රු.මිලියන 220.85 ක් ද, වශයෙන් පොහොර සහනාධාර ගෙවා තිබුණි. එක් එක් කන්නය අවසන්වීමට ප්‍රථම එම කන්න සඳහා සහනාධාර ගෙවිය යුතු වුවද, අදාළ කන්න දෙක සඳහා කන්න නිමවීමෙන් පසු රු.මිලියන 3,775.24 ක සහනාධාර ගෙවා තිබුණු බැවින් සිදු කර තිබුණු වියදම ඵලදායි වී නොතිබුණි.

### 3.5.3 කාබනික පොහොර නිෂ්පාදනය , භාවිතය හා දිරිගැන්වීමේ වැඩසටහන

ආහාර සුරක්ෂිතාවය හා ජාතික සමෘද්ධිය උදෙසා කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය ප්‍රචලිත කිරීම පෙරදැරි කර ගෙන 2008 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා රු. මිලියන 1287.06 ක් වැය කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා රු. මිලියන 100 ක ප්‍රතිපාදනවලින් රු. මිලියන 76.66 උපයෝජනය කර තිබුණි. මේ පිළිබඳව සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2016 වර්ෂයේදී කාබනික පොහොර නිෂ්පාදනය මෙ.ටො. 70.7 ක් වූ අතර 2008 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා නිෂ්පාදනය මෙ.ටො. 582 ක් වී තිබුණි. ඒ අනුව වර්ෂයකට සාමාන්‍ය නිෂ්පාදන මෙ.ටො. 64 ක අවම නිෂ්පාදනයක් වී තිබුණි.

(ආ) කාබනික පොහොර වැඩසටහනේ අපේක්ෂා කළ අරමුණුවලට අනුව සැලසුම් කළ පරිදි කාබනික පොහොර නිෂ්පාදන ගම්මාන පිහිටුවීම, පාසල් ආශ්‍රිත කොම්පෝස්ට් නිෂ්පාදන ඒකක ස්ථාපිත කිරීම, ගොවිජන සේවා මධ්‍යස්ථාන ආශ්‍රිතව කොම්පෝස්ට් ආදර්ශන ස්ථාපිත කිරීම, කොම්පෝස්ට් ආශ්‍රිත පර්යේෂණ, කොළ පොහොර වගාවන් ස්ථාපිත කිරීම යන කාර්යයන් 2012 වර්ෂයේ සිට ඉටු කර නොතිබුණි.

(ඇ) ගත වූ වර්ෂ 09 ක කාලය තුළ ලොකු පැණු, අර්තාපල් හා එළවළු ආදර්ශන 2014 වර්ෂයේ 594 ක් පමණක් පිහිටුවා තිබුණු නමුත්, ඉන් අනතුරුව කිසිදු ආදර්ශනයක් පිහිටුවා නොතිබුණි. අතහැර දැමූ පුරන් කුඹුරු අස්වැද්දීමද සිදු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ මෙම වැඩසටහන යටතේ කාබනික පොහොර වාණිජ ව්‍යාපාරයක් ලෙස ස්ථාපිත කිරීම සඳහා සහනදායී පොලී අනුපාතයක් යටතේ ණය පහසුකම් සැපයීම සඳහා අමාත්‍යාංශය විසින් සාරලංකා ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කර තිබුණි. ඒ සඳහා රු.මිලියන 50.00 ක ප්‍රතිපාදන සලසා තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 32.00 ක ගොවි බැංකු මඟින් ගොවීන් වෙත ණය ලබා දී තිබුණු නමුත්, මේ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී ගම්පහ දිස්ත්‍රික්කයේ හැර පහත සඳහන් කර ඇති අනෙකුත් දිස්ත්‍රික්කවල සමස්ත කාබනික පොහොර නිෂ්පාදන මට්ටම සතුටුදායක තත්ත්වයක නොතිබුණි. විස්තර පහත පරිදි විය.

| දිස්ත්‍රික්කය | ප්‍රදේශය | ණය ලබා ගත් සංඛ්‍යාව | ලබාගත් ණය මුදල | නිරීක්ෂණය |
|---|---|---|---|---|
| | | | රු. | |
| අනුරාධපුරය | කටියාව | 04 | 2,000,000 | ණයලාභීන් සිව්දෙනෙකු සම්බන්ධයෙන් සිදු කල නියැදි විගණන පරීක්ෂාවේදී 2016 ජුලි 25 දින වනවිටත් ණයලාභීන් දෙදෙනෙකු විසින් ණය ලබාගත් කාර්යයන් කිසිවක් ඉටු කර නොතිබුණු අතර එක් ණයලාභියෙකු රජයේ සේවයේ නියුක්ත අයෙකු විය. අනෙකුත් ණයලාභීන් දෙදෙනා විසින් ප්‍රමාණවත් පරිදි කාබනික පොහොර නිෂ්පාදනය සිදු කර නොතිබුණි. |
| බදුල්ල | හල්දුම්මුල්ල | 02 | 500,000 | ණය ලබාගත් අයෙකු විසින් රු.200,000 ක ණයක් පියවීම සඳහා යොදා ගෙන තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| බදුල්ල | බණ්ඩාරවෙල | 02 | 500,000 | ණයලාභියෙකු විසින් රු.100,000 ක කැබලි කිරීමේ යන්ත්‍රයක් මිලදී ගෙන තිබුණි. එමෙන්ම ගව ගාලක් ඉදි කිරීම හා සිමෙන්ති ජල ටැංකියක් ඉදිකෙරෙමින්ද පැවතුණි. කාබනික පොහොර නිෂ්පාදනය සිදු කර නොතිබුණි. |

### 3.5.4 දීප ව්‍යාප්ත ගොවි සතිය

2016 ඔක්තෝබර් 05 දින සිට 2016 ඔක්තෝබර් 16 දින දක්වා පැවැත්වූ කෘෂිකර්ම සතිය සඳහා රු.මිලියන 60.05 ක් වැය කර තිබුණි. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ මුලිකත්වයෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා කෘෂිකර්ම අමාත්‍යාංශය ඇතුළු ඊට අනුබද්ධ අනෙකුත් ආයතන 3 ක් ද එක්ව මෙම වැඩසටහන පවත්වා තිබුණි. ඒ අනුව ගොවිජන සේවා දෙපාර්තමේන්තුව යටතේ කිරි අම්මාවරුන් සඳහා දානය, ගොවි සම්මේලනය, කඩවර පෙරහැර හා දිස්ත්‍රික්ක මට්ටමේ වැඩසටහන් සඳහා රු.මිලියන 25.60 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(අ) මාධ්‍ය ආවරණ කටයුතු අභ්‍යන්තර විගණන අංශයේ නිලධාරීන්ගේ මූලිකත්වයෙන් ඉටුකර කිරීම නිසා එහි අභ්‍යන්තර පරීක්ෂාව දුර්වල වී තිබුණි .

(ආ) 2015 මාර්තු 31 දිනැති අංක 02/2015 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව මුදල් අනිසි භාවිතය වැළැක්වීම හා විවිධ ප්‍රචාරණ කටයුතු සඳහා වියදම් නොකිරීමට කටයුතු කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීව වී තිබුණත්, අමාත්‍යාංශය විසින් මාධ්‍ය ආවරණ කටයුතු සඳහා රු.මිලියන 16.78 ක් වැය කර තිබුණි. එය මුළු වැඩසටහනේ වියදමින් සියයට 28 ක් වූ අතර 2016 ඔක්තෝබර් 12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව අදාළ මාධ්‍ය ආවරණ කටයුතු සඳහා ආයතනය තෝරා ගෙන තිබුණි.

### 3.5.5 ලියාපදිංචි බිත්තර වී භාවිතා කරමින් තම අවශ්‍යතා නිෂ්පාදනය කිරීමේ වැඩසටහන

ගොවීන් 160,000 දෙනෙකු සඳහා වැඩි දියුණු කළ ප්‍රභේදවල ලියාපදිංචි බිත්තර වී 1kg ක්ද, ගොවීන් 20,000 ක් සඳහා එක් ගොවියෙකුට පාරම්පරික වී 250g ක් හා ගොවීන් 180,000 කට පැරිෂුට් තැටි 4,120,000 ක් නොමිලේ ලබාදීම සඳහා රු.මිලියන 18.67 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(අ) අමාත්‍යාංශය විසින් පැරෂුට් තැටි 1,000,000 මිලදී ගැනීම සඳහා ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 12.00 කට වැඩි වටිනාකමකින් යුත් ප්‍රසම්පාදනය සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව ජාතික තරගකාරී ලංසු කැඳවීමේ ක්‍රමය භාවිතා කළ යුතු වුවත්, ඊට පටහැනිව වෙළෙඳපල මිල සැදැහුම් ක්‍රමය භාවිතා කර තිබුණි.

(ආ) වැඩසටහන ආරම්භ කරන විට ගොවීන් වගාව ආරම්භ කර තිබීම, මෙම විශේෂිත වී වර්ගය හා පැරිෂුට් තැටි විශාල ප්‍රමාණයක් එකවර සපයා ගැනීම ප්‍රායෝගිකව දුෂ්කර වීම, කෘෂි පර්යේෂණ

නිලධාරීවරුන්ගෙන් බීජ වී පැකට් අවශ්‍යතාවය සහ සුදුසු ගොවීන්ගේ තොරතුරු ඇතුළත් ආකෘති ලබා ගැනීම ප්‍රමාදවීම යන හේතූන් නිසා මෙම වැඩසටහනේ ප්‍රගතිය සියයට 35 ක් පමණක් වී තිබුණි.

### 3.5.6 කුඩා වැව් හා ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩසටහන

අතහැර දමන ලද වැව් පිළිසකර කිරීම, ගොවීන්ට අවශ්‍ය ජලය අඛණ්ඩව සැපයීම සඳහා අමුණු ප්‍රතිසංස්කරණය කිරීම හා ජල ප්‍රවාහ පද්ධති, ඇල මාර්ග වැඩි දියුණු කිරීමේ අරමුණෙන් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 2,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර ඉන් රු.මිලියන 1,971 ක් උපයෝජනය කර තිබුණි. මෙම වැඩසටහන පිළිබඳව අනුරාධපුරය, ගම්පහ, මහනුවර හා කළුතර දිස්ත්‍රික්කවල සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) කොන්ත්‍රාත් පිරිනැමීම සඳහා අතරමැදියෙකු ලෙස ගොවි සංවිධාන යොදා ගැනීම මූලික අරමුණු වී තිබුණු අතර ගොවි සංවිධානවල බහුතර සාමාජිකයින්ට ව්‍යාපෘතිය පිළිබඳව ප්‍රමාණවත් අවබෝධයක් හෝ උනන්දුවක් නොතිබුණි. පරීක්ෂා කළ දිස්ත්‍රික්ක 3 ක් තුළ රු.14,673,434 ක් වූ ව්‍යාපෘති ගොවි සංවිධාන විසින් භාරගෙන බාහිර කොන්ත්‍රාත්කරුවන් ලවා ඉටු කර ගෙන තිබුණි.

(ආ) 2016 ජනවාරි 07 දිනැති අංක 01/2016 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයෙහි (iv) ඡේදය සහ 2016 සැප්තැම්බර් 08 දිනැති අංක MNPEA 03/2016 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 07 ඡේදය පරිදි මෙම ව්‍යාපෘති උප කොන්ත්‍රාත්කරුවන් හරහා ක්‍රියාත්මක වීම වැළැක්විය යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණු අතර එසේ කටයුතු කර තිබුණු ගොවි සංවිධාන අසාදු ලේඛනගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ඉහත ප්‍රතිශෝධිත චක්‍රලේඛයේ 30 ඡේදය ප්‍රකාරව ගොවි සංවිධානවලට ව්‍යාපෘතිය ඉටු කිරිමට අවශ්‍ය පිරිස්, උපකරණ හා මූල්‍ය ධාරිතාව සමිතිය සතු බව සනාථ කරගෙන නොතිබුණි. පරීක්ෂා කරන ලද බොහෝමයක් ගොවි සංවිධානවල බැංකු ගිණුම්වල පැවතුන ශේෂය රු.200,000 කට වඩා අඩු ශේෂ විය.

(ඈ) දිස්ත්‍රික්ක 4 ක ව්‍යාපෘති පිළිබඳව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(i) ගම්පහ දිස්ත්‍රික්කයේ මීනුවන්ගොඩ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ 2016 ජුනි 26 දින රු.2,049,685 ක් වැය කර ඉදිකර තිබුණු අමුණ කැඩී තිබුණු නිසා භාවිතයට ගැනීමට නොහැකි වී තිබුණි. ඒ අවට වගා කළ විශාල වෙල් යායක අඩි දෙකක් හෝ තුනක් පමණ ජලය පිරී පැවතුණි.

(ii) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඉලුපන්කඩවල සිට ඉදිගස්පොතාන දක්වා කෘෂිපාර හා ඉහළ ඉදිගස්පොතාන පහලතලාව කෘෂිපාර සඳහා පිළිවෙලින් රු.1,527,215 ක් හා රු.1,032,924 ක් වැය කර තිබුණි. එම කෘෂිපාරවල් සැලැසුම් කළ පරිදි ඉදි නොකිරීම හේතුවෙන් බෝක්කුවේ පැති බැම්වලට හානි පැමිණීමේ අවධානමක් පැවතුණි.

(iii) පරීක්ෂා කළ දිස්ත්‍රික්ක 4 හි කෘෂි මාර්ග අදාළ පිරිවිතර අනුව ඉදිකර නොතිබුණු අතර ඇල මාර්ග නිසි පරිදි නඩත්තු නොකිරීම නිසා වල් බිහි වී තිබුණි.

(iv) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 22(1) ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකාවේ සියළුම පළාත්වල පරිපාලන භාෂාව සිංහල විය යුතු අතර, ඊට පටහැනිව මෙම ව්‍යාපෘතිවලට අදාළ සියලුම ඇස්තමේන්තු ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සකස් කර තිබුණි. ගොවි සංවිධාන කොන්ත්‍රාත්කරුවන් ලෙස කටයුතු කරන මෙම ව්‍යාපෘතිවල ඇස්තමේන්තු සිංහල භාෂාවෙන් සකස් කිරීම වැදගත් කරුණක් වී තිබුණත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඉ) 2016 ජනවාරි 07 දිනැති අංක 01/2016 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයේ 2 ඡේදය ප්‍රකාරව සඳහන් නිර්නායකයන් අනුව ව්‍යාපෘතීන් ප්‍රමුඛතා ගත කිරීම සිදු කළ යුතු වුවත්, මෙම වැඩසටහන යටතේ වූ ව්‍යාපෘති සම්බන්ධයෙන් එසේ සිදු කර නොතිබුණි.

(ඊ) 2016 ජනවාරි 07 දිනැති අංක 01/2016 දරන ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයේ (v) ඡේදයේ ප්‍රකාරව ව්‍යාපෘති පසුවිපරම් හා නඩත්තු කටයතු ප්‍රමාණවත් පරිදි ඉටු කර නොතිබුණි.

**3.5.7 ගම්දොර විශේෂ වැඩසටහන**

**-----------------------------**

2016-2018 ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන යටතේ වී, අතිරේක භෝග, එළවළු හා පළතුරු වගාවන්, කාබනික පොහොර නිෂ්පාදනයන් හා වෙනත් විශේෂ කෘෂිකර්ම ක්‍රියාකාරකම් අධීක්ෂණය සහ කෘෂිකර්ම ව්‍යාපෘති ක්‍රියාත්මක කරන නිලධාරීන්ගේ ප්‍රායෝගික දැනුම, තාක්ෂණ දැනුම වැඩි කිරීම සඳහා මුළු දිවයිනම ආවරණය වන පරිදි 2016 අගෝස්තු 16 දින දක්වා කාලය තුල "ගම්දොර"නමින් විශේෂ වැඩසටහනක් ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කර තිබුණි. 2016 වර්ෂයේදී මේ යටතේ විවිධ ක්‍රියාකාරකම් 15 ක් සිදු කිරීමට අපේක්ෂා කර තිබුණු අතර ඒ සඳහා රු.58,421,236 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ .

(අ) වැඩසටහන සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණු අතර අමාත්‍යාංශයේ ක්‍රියාකාරි සැලැස්ම තුළද ඇතුළත් කර නොතිබුණි. මෙම වැඩසටහන සඳහා 2016 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව මගින් මුලා ප්‍රතිපාදන සලසා ගෙන නොතිබුණි. මේ සඳහා අමතර ප්‍රතිපාදන ඉල්ලා තිබුණද නිවැරදි අනුමත කර ගැනීමේ ක්‍රමවේදයන් අනුගමනය කර නොතිබු බැවින් භාණ්ඩාගාර විසින් අනුමැතිය ඒ සඳහා ලබාදී නොතිබුණි.

(ආ) වැඩසටහන සඳහා ප්‍රතිපාදන නොලැබීම නිසා පොහොර සහනාධාරය සඳහා ප්‍රතිපාදන සලසා තිබුණු වැය විෂයෙන් රු.මිලියන 62 ක් වීරමොන් පරිපාටිය යටතේ මාරු කරගෙන තිබුණි. ඒ හේතුවෙන් පොහොර සහනාධාර වැඩසටහනට අවශ්‍ය ප්‍රතිපාදින අඩුවීම නිසා සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.19,788,418 ක බැරකම්වලට එළඹීමට සිදුවී තිබුණි.

(ඇ) රාජ්‍ය ආයතනවල ප්‍රචාරණය අංක අමප/08/2253/338/043 හා අමප/10/1682/407/04 දරන අමාත්‍ය මණ්ඩලයේ තීරණයෙන් සැලසීනේ ආයතනය මගින් සිදු කළ යුතු බව සඳහන් කල තිබුණත්, ඒ වෙනුවට රු.2,543,201 ක් ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය විසින් පෞද්ගලික ආයතනයකින් ලබාගෙන එහි ප්‍රචාරණය ඉටු කරගෙන තිබුණි.

(ඈ) වැඩසටහනේ අරමුණු අනුව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් රැස්කළ දත්තවලින් දත්ත පද්ධතියක් සකස් කර නොතිබුණි.

(ඉ) මෙම වැඩසටහන අධීක්ෂණය සඳහා අමාත්‍යාංශයේ නිලධාරීන් ද ඇතුළුව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විධායක නිලධාරීන් පත් කර තිබුණු නමුත්, එවැනි අධීක්ෂණයක් සිදු කළ බව තහවුරු කෙරෙන සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. .

## 3.6 කොන්ත්‍රාත් පාලනය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශය මගින් කුන්ඩසාලේ ඉදිකරන ලද වැසි ආවරණය පිළිබඳව සිදු කළ භෞතික පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දේශිය ලොකු ළූණු බීජ නිෂ්පාදන වැඩසටහන සඳහා වැසි ආවරණ 15 ක් ඉදිකිරීමේ කාර්යය බීජ හා රෝපණ අධ්‍යක්ෂ විසින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු වෙත පවරා තිබුණු අතර ඒ සඳහා රු. මිලියන 20 ක ප්‍රතිපාදන සලසා තිබුණි. මේ සම්බන්ධයෙන් ස්ථානීය පරීක්ෂාවන් සිදු නොකර පොදුවේ අදාළ ස්ථාන සඳහා එක් වැසි ආවරණයක් සඳහා රු.1,335,879 ක පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර තිබිණි.

(ආ) වැහි ආවරණ ඉදිකිරීම සඳහා ආයතන 23 කින් ලංසු කැඳවා තිබුණු අතර, ලංසු ඉදිරිපත් කළ යුතු කාලය දින 7 කට සීමා කර තිබුණි. ප්‍රසම්පාදන කටයුතු කෙටි කාලයකින් නිම කිරීමට සිදු වී තිබුණු බවත්, ඒ අනුව ලංසු ඉදිරිපත් කිරිමට දින 07 ක කාලයක් ලබා දුන් බව අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සඳහන් කර තිබුණද, කොන්ත්‍රාත්තුව නිම කිරීමට දින 448 ක් ප්‍රමාද කර තිබුණි.

## 3.7 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) **කෘෂිකර්ම අමාත්‍යාශය සඳහා බඳු පදනම මත ලබාගත් ගොඩනැගිල්ල**

2015 සැප්තැම්බර් 27 දිනැති අංක 15/130/702/007 දරන අමාත්‍ය මණ්ඩල තිරණය අනුව පාර්ලිමේන්තුවේ කාරක සභා ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම හා අතිරේක කාර්යාල ඉඩකඩ අවශ්‍යතාවය සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ස්ථාපිත කර ඇති ගොවිජන මන්දිරය ගොඩනැගිල්ල යොදා ගැනීමට තිරණය කර තිබුණි. ඒ සඳහා රාජගිරියේ අංක 288 ස්ථානයේ ඉදි කර තිබුණු මහල් 9 කින් යුත් ගොඩනැගිල්ලක් බදු පදනමට ලබාගෙන තිබුණි. එම ගනුදෙනුව පිළිබඳ පරීක්ෂා කිරීමේදි පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අවශ්‍ය වූ වර්ග අඩි ප්‍රමාණයට ගැලපෙන කාර්යාල පහසුකම් සෙත්සිරිපාය ගොඩනැගිල්ලෙන් ලබාගත හැකිව තිබූ නමුත් ඉඩකඩ ප්‍රමාණවත් නොවන බව හඟවමින් අවශ්‍ය වර්ග අඩි ප්‍රමාණයට වඩා වර්ග අඩි 36500 ක් ඉක්මවූ ඉහත සඳහන් මහල් 09 ක ගොඩනැගිල්ල කුලී පදනම මත ලබා ගෙන තිබුණි. එම ගොඩනැගිල්ල ඉදිකිරීමට පෙර ගොඩනැගිලි සැලැස්ම අනුමත කිරීමේදී නාගරික සංවර්ධන අධිකාරියේ බස්නාහිර පළාත් අධ්‍යක්ෂ විසින් මහල් ගණන 07

කට සීමා කර ගොඩනැගිල්ලේ සැලැස්ම අනුමත කර තිබුණි. ඊට පටහැනිව මහල් 09 කින් යුතුව මෙම ගොඩනැගිල්ල ඉදිකර තිබුණි.

(ii) මුදල් රෙගුලාසි 835(2)(ඉ) ප්‍රකාරව උපරිම වශයෙන් බදු කාලය වර්ෂ 3 කට සීමා විය යුතු වුවද, බදුකරුගේ අවශ්‍යතාවය මත එය වර්ෂ 05 ක කාලයක් සඳහන් කර බදු ගිවිසුමට එළඹ තිබුණු අතර වර්ෂ 03 කින් පසු බදු කුලිය සියයට 15 කින් වැඩි කිරීමටද එකග වී තිබුණි. බදුකරුගේ ඉල්ලීම මත අත්තිකාරම් මුදල් ගෙවීම සඳහා පනවා තිබූ කොන්දේසිය මත වර්ෂ 2 ක බදු කුලිය එකවර ගෙවීම හා තුන්වන හා හතරවන වර්ෂවලදී එය හිලව් කිරීමට වූ කොන්දේසි පිළිගෙන තිබුණි. තවද ප්‍රධාන තක්සේරුකරු විසින් එම ගොඩනැගිල්ලේ මාසික කුලිය රු.මිලියන 13.5 ක් ලෙස තක්සේරු කර තිබුණත්, ඊට පටහැනිව මාසයකය රු.මිලියන 21 ක කුලියක් ගෙවීමට එකඟ වී තිබුණි.

(iii) 2016 අප්‍රේල් 07 දින රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේදී එහි සමාජිකයින් විසින් ගොඩනැගිල්ල කුලියට ගැනීම සම්බන්ධයෙන් වූ තීරණ පිළිබඳව විවේචනාත්මක කරුණු ඉදිරිපත් කර තිබුණු අතර එම ගිවිසුම අත්සන් කිරීමේ ප්‍රශ්න ගත කරුණු පිළිබඳ රාජ්‍ය ගිණුම් කාරක සභාවේ අනුමැතිය ලැබී නොතිබුණි. තවද මෙම ගනුදෙනුව සඳහා අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ හා නීතිපතිවරයාගේ උපදෙස් අනුව කටයුතු කිරීමට නියෝග කර තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(iv) අතිරේක වර්ග අඩි 36500 ක් වූ කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පවතින කුලියට ලබා ගත් කෘෂි රක්ෂණ මණ්ඩලය මෙහි ස්ථාපනය කිරීමට යෝජිත බව අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත දන්වා තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(v) 2016 අප්‍රේල් මාසය සිට 2017 ජුලි මාසය දක්වා මේ සඳහා කුලි වශයෙන් රු.මිලියන 315.00 ක් ද එකතු කළ අගය මත බදු (VAT) හා ජාතිය ගොඩනැගීමේ බදු (NBT) සඳහා රු.මිලියන 53.64 ක් හා රු.මිලියන 504.00 ක අත්තිකාරම්ද ඇතුළුව එකතුව රු.මිලියන 872.64 ක් 2017 ජුලි 31 දින වන විට ගෙවා තිබුණි.

(vi) මාස 15 ක කාල සීමාවක් ගොඩනැගිල්ල පරිහරණය කර නොතිබුණු අතර, එම කාලය සඳහා සේවා ගාස්තු වශයෙන් මාසයකට රු.මිලියන 6.18 ක් බැගින් රුතමිලියන 92.70 ක් ගෙවා තිබුණි.

(vii) මෙම ගොඩනැගිල්ල තෝරා ගැනීමේදී අමාත්‍යාංශය සතු වාහන හා දෛනිකව විවිධ රාජකාරි සඳහා ප්‍රාදේශිය කාර්යාලවලින් පැමිණෙන වාහන නවතා තැබීමේ පහසුකම් පැවතිය යුතු වීම පිළිබඳව අවධානය යොමුකර නොතිබුණි.

(viii) එසේම මෙම ගොඩනැගිල්ල කාර්යාල සංකීර්ණයක් ලෙස භාවිතා කිරීමට අවශ්‍ය පාටිෂන් කිරීම්, බුමුතුරුණු ඇතිරීම හා තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා 2016 අගෝස්තු 17 දිනැති අංක අමප/16/1491/728/011-II දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රු.මිලියන 402.6 ක ප්‍රතිපාදනය සලසා තිබුණු අතර 2017 නොවැම්බර් මාසය වන විට රු. මිලියන 147.9 ක් වැය කර තිබුණි.

(ix) ගිවිසුම්වලට එළඹෙන අවස්ථාවේ පැවති විදුලි පද්ධතිය ප්‍රමාණවත් ධාරිතාවයක් නොතිබීම නිසා නැවත සකස් කර තිබුණු අතර ගොඩනැගිල්ල බදු ගැනීමට පෙර ශක්‍යතා අධ්‍යනය කර නොතිබීම නිසා ඉහත ගැටළු මතු වී තිබුණි.

**(ආ) ගුවන් ප්‍රවේශපත් වෙනුවෙන් අතිරේක ගාස්තු ගෙවීම**

**------------------------------------------------------------**

කෘෂිකර්ම අමාත්‍යවරයා සහ අමාත්‍ය උපදේශකවරයා 2016 ජූනි 07 දින සිට ජූනි 11 දින දක්වා කාලය තුළ බෙල්රුස් රාජ්‍යයේ පැවති කෘෂිකාර්මික ප්‍රදර්ශනයකට සහභාගීවීම සඳහා විදේශ ගතවීම සඳහා ලබාගත් ගුවන් ප්‍රවේශ පත්වල ගුවන් ගතවන දිනයන් අවස්ථා 02 කදී වෙනස් කිරීම නිසා රු.129,055 ක අතිරේක ගාස්තුවක් ගෙවීමට සිදුවී තිබුණි.

**3.8 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**-------------------------------------**

අමාත්‍යාංශය සතු ධාවන තත්ත්වයේ නොතිබුණු වාහන 11 ක් වර්ෂ 10 ක කාලයක් ඉක්මවා අබලන්ව පැවැති අතර, ඉන් වාහන 08 ක් විකිණීමට තිරණය කර තිබුණි. එහෙත් එම වාහන අපහරණය කිරීම සඳහා පත්කළ කමිටුව විසින් වාහනවල වෙළඳපල ඉල්ලුම හා අමතර කොටස් අළුත්වැඩියා කිරීමේ පිරිවැය පිළිබඳ සැලකිලිමත් නොවී වාහනයේ වත්මන් වටිනාකමට වැඩියෙන් වටිනාකම තක්සේරු කිරීම නිසා වාහන 05 ක් අලෙවියෙන් ලබාගත හැකිව තිබූ එකතුව රු.5,515,638 ක් අහිමි වී තිබුණි.

**3.9 නිෂ්ක්‍රීය වත්කම් උපයෝජනය**

**--------------------------------**

ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන යටතේ 2016 වර්ෂයේදී මිලදීගත් රු. මිලියන 111.3 ක වර්ග 10 කට අයත් යන්ත්‍රෝපකරණ 690 ක් 2017 අප්‍රේල් 08 දින අනුරාධපුර සල්ගාදු ක්‍රීඩාංගනයේදී ගොවි සංවිධාන වෙත නොමිලේ බෙදා දී තිබුණි. එම යන්ත්‍රෝපකරණ ලබාගත් පුද්ගලයන් හා සංවිධාන තෝරාගත් පදනම පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද මෙම යන්ත්‍රෝපකරණවලින් 40 ක් තවදුරටත් අනුරාධපුර ගොවිපල යාන්ත්‍රික අභ්‍යාස මධ්‍යස්ථානයේ 2017 ජූලි 25 දින වන විටත් නිෂ්ක්‍රීය පැවතුණි.

**3.10 වාහන උපයෝජනය**

**-----------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ**.**

(අ) අමාත්‍යාංශයේ 2015 වර්ෂයේ වාහන අපහරණය සඳහා පත්කළ තක්සේරු මණ්ඩලය විසින් වාහන දෙකක එන්ජින් අංක ලියාපදිංචි සහතිකය සමඟ නොගැලපෙන බැවින් තක්සේරු කර නොතිබුණි. තවත් වාහනයක් ලියාපදිංචිය අවලංගු කිරීම සඳහා ප්‍රමාණවත් තොරතුරු නොතිබුණු බැවින් වෙන්දේසි කළ නොහැකි වී තිබුණි. 2017 ජූලි 31 දින වන විටත් එම වාහන නිෂ්ක්‍රියව පැවතුණි.

(ආ) අමාත්‍යාංශය සතු වාහන 12 ක් වර්ෂ 01 ක සිට වර්ෂ 04 ක් දක්වා නිෂ්ක්‍රියව පැවති අතර 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන චක්‍රලේඛයේ 12 ඡේදය ප්‍රකාර වෙන්දේසි කිරීමට කටයුතු කර නොතිබුණි. මේ පිළිබඳව සිදු කළ භෞතික පරීක්ෂාවේදී එම වාහන අ අමාත්‍යාංශය පරිශ්‍රයේ අව්, වැසිවලට හසුවෙමින් දිරාපත් වන බව නිරීක්ෂණය විය.

(ඇ) 2016 අප්‍රියෙල් 11 දින අනුරාධපුර ප්‍රදේශයේදී අමාත්‍යාංශය සතු කැබ් රථයක් ඇදගෙන යාමේදී අනතුරකට භාජනය වී තිබුණි. මේ පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

(i) අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාර වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ii) මෙම අනතුර සම්බන්ධයෙන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද පරීක්ෂාවෙන් පසුව ඉදිරිපත් කරන ලද මෝටර් රථ කාර්මික වාර්තාව අනුව රථයේ අත් තිරිංග හා සුක්කානම් පද්ධතිය මනා ක්‍රියාකාරිත්වයෙන් යුක්ත බව හා ක්ලච් පද්ධතිය මෙම අනතුරු හා ඍජුව සම්බන්ධයක් නොමැති බව වාර්තා කර තිබුණි. එසේම අනතුර සිදුවන අවස්ථාවේ තිරිංග මනා ක්‍රියාකාරිත්වයෙන් තිබියදී රියදුරු තම අසුන මත සිටින අවස්ථාවදී අනතුර වලක්වා ගැනීමට ක්‍රියා නොකිරීමෙන් හා නිසි ක්‍රමවේදයට අනුව ඇදගෙන ගොස් නොතිබීම හේතුවෙන් නොසැලකිලිමත්භාවය නිසා අනතුර සිදු වී තිබුණු බව තහවුරු කර තිබුණත් අමාත්‍යාංශය විසින් ඒ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා නොතිබුණි.

(iii) මෙම රථය අලුත්වැඩියාව සම්බන්ධව නියෝජිත ආයතනය විසින් වැසියට හානි වීම නිසා රථය අලුත්වැඩියා කළ නොහැකි බව දන්වා තිබුණි. මේ පිළිබඳ මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව පරීක්ෂණ සඳහා පත්කළ කමිටුව විසින් ඒ සඳහා වගකිව යුතු පාර්ශවය සම්බන්ධයෙන් ගත යුතු විනය ක්‍රියාමාර්ග සඳහන් කර නොතිබුණු බව අමාත්‍යාංශයේ ලේකම් විසින් විගණනය වෙත දන්වා තිබුණි.

(ඇ) අමාත්‍යාංශය සතු තවත් වාහනයකට සිදු වී තිබුණ අනතුරක් සම්බන්ධ මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව පරීක්ෂණය 2017 ජුනි 30 දින වන විටත් පවත්වා නොතිබුණි.

## 3.11 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 138 | 105 | 33 | - |
| (ii) | තෘතියික මට්ටම | 11 | 06 | 05 | - |
| (iii) | ද්විතියික මට්ටම | 1,359 | 1,079 | 280 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 156 | 127 | 29 | - |
| (v) | වෙනත්(අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 09 | - | 09 |
| | **එකතුව** | **1,664** | **1,326** | **347** | **09** |